සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විෂය : ව්‍යාපාර හා ගිනුම්කරණ අධ්‍යයනය

සතිය : 2021.05..03 සිට 2021.05.07

ශ්‍රේණිය: 10

සකස් කරන ලද්දේ : දෙහිඕවිට අධ්‍යාපන කලාපය

ඔබගේ පෙළපොතේ "4- ගිනුම්කරණය හැඳින්වීම" පාඩම (පිටු අංක 48 - 52) හොඳින් කියවා පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1) **කෙටි නිශ්චිත පිළිතුරු ලියන්න**.
   - i) ගිනුම්කරණය යන්න හඳුන්වන්න
   - ii) ගිනුම්කරණයේ ප්‍රධානතම අරමුණ කුමක්ද?
   - iii) ගිනුම්කරණයේ උප අරමුණු 2ක් නම් කරන්න
   - iv) මුදලින් මැනිය හැකි ගනුදෙනු සඳහා නිදසුන් 3 ක් ලියන්න.
   - v) ගනුදෙනුවල ප්‍රතිඵල ප්‍රධාන කොටස් 5කට බෙදිය හැකිය. ඒවා නම් කරන්න.
   - vi) වත්කමක දැකිය හැකි ලක්ෂණ 2ක් සඳහන් කරන්න.
   - vii) වත්කම් ප්‍රධාන වර්ග 2කට බෙදේ. ඒවා නම් කරන්න.
   - viii) වගකීම් අර්ථ දක්වන්න.
   - ix) වගකීමක දැකිය හැකි ලක්ෂණ 2ක් සඳහන් කරන්න.
   - x) වගකීම් බෙදෙන ප්‍රධාන කොටස් 2 නම් කරන්න.

2) **පහත ප්‍රකාශන වල හිස්තැන් නිවැරදි පිළිතුරු යොදා සම්පූර්ණ කරන්න**.
   - i) ව්‍යාපාරික තීරණ ගැනීමට අදාළ මූල්‍යමය තොරතුරු සපයන ගිනුම්කරණය ...........................නම් වේ.
   - ii) ගිනුම්කරණය මගින් ඇල්මැති පාර්ශව වෙත සපයන විවිධ වාර්තා ............................ලෙස හැඳින්වේ.
   - iii) ව්‍යාපාරයක් හා වෙනත් පාර්ශව අතර සිදුවන සම්පත් හුවමාරු වීම ...........................................නම් වේ.
   - iv) ව්‍යාපාරයක සිදුවන විවිධ ස්වරූපයේ ගනුදෙනු අතරින් ගිනුම්කරනයේදී සැලකිල්ලට ගනු ලබන්නේ .......................................මැනිය හැකි ගනුදෙනු පමණි.
   - v) ගනුදෙනු සිදුවන අවස්ථාවේදීම ඒවායෙහි වටිනාකම බේරුම් කිරීම....................... ගනුදෙනු නම් වන අතර වටිනාකම පසුව බේරුම් කිරීම ........................ ගනුදෙනු නම් වේ.